මගේ අංකය - එන්සීපි/සීඑස්/පීටී/එෆ්ආර්/05/07
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
දිනය - 2021.03. 19

උතුරු මැද පළාත් සභාවේ සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් වෙත.

<u>දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ ප්‍රතිපත්තිය</u>

උක්ත හිසින් යුතුව 2020.11.24 දිනැතිව නිකුත් කර ඇති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2020/10 කොරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 4.1 (iii) (ආ), (iv) සහ (v) උප ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත විධිවිධාන ඇතුළත් කෙරේ.

4.1. ඉදිකිරීම් කර්මාන්තය

(iii) (ආ) (i) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 150 ට වැඩි හා රුපියල් මිලියන 300 දක්වා වන කොන්ත්‍රාත් සඳහා මිළ කැඳවීම්වලදී, CIDA මඟින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සීමාවක් මත පදනම්ව, CIDA C3 සහ C2 ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1] (උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වෙතින් පමණක් මිල ගණන් කැඳවිය යුතුය.

(ආ) (ii) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 300 ට වැඩි හා රුපියල් මිලියන 600 දක්වා වන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම්වලදී, CIDA මඟින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සීමාවන් මත පදනම්ව, CIDA C2 සහ C1 ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1] (උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වෙතින් පමණක් මිලගණන් කැඳවිය යුතුය.

---

1 "දේශීය බහුතර හිමිකාරීත්වයක් සහිත ආයතන, ස්වදේශීය ආයතන හෝ දේශීය සමාගමක්" යනු ශ්‍රී ලංකිකයන් විසින් සියයට 51 කට වඩා වැඩි හිමිකාරීත්වයක් දරනු ලබන සහ ශ්‍රී ලංකාවේ අදාළ අධිකාරියක් යටතේ එහි මුල් ලියාපදිංචිය සිදු කර ඇති ආයතනයක් වන අතර, මෙම ලේඛණය සඳහා සමස්ථයක් වශයෙන් මෙම අර්ථ දැක්වීම අදාළ වේ.

(iv) මෙම කර්මාන්ත සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යභාරය සැළකීමේදී, එකී රාජ්‍ය ව්‍යවසායන් විසින් තරඟකාරී මිළ කැඳවීම් සඳහා මිළ ගණනක් ඉදිරිපත් කර ඇති විට, එම රාජ්‍ය ව්‍යවසායන් සඳහා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ට වඩා සියයට 5 (5%) ක විශේෂ වරණයක් ලබා දිය යුතුය. මෙම වරණය තාක්ෂණික ඇගයීමේදී නොව මූල්‍ය ඇගයීමේදී පමණක් ලබා දිය යුතුය.

(v). අසාමාන්‍ය ලෙස මිල උච්ඡාවචනයන් සහිත ලංසු ඉදිරිපත් කිරීම වැළැක්වීම තහවුරු කිරීම සඳහා පහත නිර්ණායකවලට අනුගත විය යුතුය.

(අ). ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 11 (11%) සිට සියයට 19 (19%) දක්වා අඩුවන අවස්ථාවලදී කාර්ය සාධන සුරක්ෂණය සියයට 5 (5 %) කින් වැඩි කළ යුතුය.

(ආ). ලංසු මිළ, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 20 (20%) සිට සියයට 29 (29%) දක්වා අඩුවන අවස්ථාවලදී කාර්ය සාධන සුරක්ෂණය සියයට 10 (10%) කින් වැඩි කළ යුතුය.

(ඇ). ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 30 (30%) කින් හෝ ඊට වැඩි ප්‍රතිශතයකින් අඩුවන අවස්ථාවලදී එම ලංසුව ප්‍රතික්ෂේප කළ යුතුය.

03. මෙම චක්‍රලේඛය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කරනු ලබන අතර, මෙහි ඇත්ළත් විධිවිධාන 2021.01.01 දින සිට බලපැවැත්වේ.

එච්.එම්. පී. බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුර මැද පළාත.

පිටපත් - 1. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, උ.මැ.ප.

2. ප්‍රධාන අභ්‍යන්තර විගණක, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උ.මැ.ප.